ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2013 ජූලි 31 වැනි දින |

**2013 ජූලි මාසයේ දී උද්ධමනය තවදුරටත් පහළ යයි.**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) (2006/2007=100) මගින් මනිනු ලබන උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත පූර්ව මාසයේ පැවති සියයට 6.8 හි සිට 2013 ජූලි මාසයේ දී සියයට 6.1 දක්වා පහළ වැටිණි. උද්ධමනයේ මෙම පහළ යාම දක්නට ලැබුණේ අනුයාත දෙවන මාසයටයි. වාර්ෂික සාමාන්‍ය පදනම මත උද්ධමන අනුපාතිකය ද පූර්ව මාසයෙහි වාර්තා කළ සියයට 8.6 හි සිට 2013 ජූලි මාසයේ දී සියයට 8.3 දක්වා පහළ වැටිණි.

මූලික උද්ධමනය ලක්ෂ්‍යමය සහ වාර්ෂික සාමාන්‍ය යන දෙයාකාරයෙහි ම පදනම මත පිළිවෙළින් ජූනි මාසයේ පැවති සියයට 4.3 හි සහ සියයට 6.4 හි සිට 2013 ජූලි මාසයේ දී පිළිවෙළින් සියයට 3.1 සහ සියයට 6.2 දක්වා අඛණ්ඩව පහළ වැටිණි.




කො.පා.මි. දර්ශක අගය 2013 ජූනි මාසයේ පැවති 176.5 හි සිට 2013 ජූලි මාසයේ දී 176.8 දක්වා නිරපේක්ෂ වශයෙන් වැඩි වෙමින් පූර්ව මාසයට සාපේක්ෂව සියයට 0.2 කින් ඉහළ නැගිණි. ආහාර හා මධ්‍යසාර නොවන පාන වර්ග අයත් උප කාණ්ඩයේ මිල ගණන් සියයට 0.2 කින් ඉහළ යාම දර්ශකයේ මෙම මාසික වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් දායක විය. ආහාර කාණ්ඩය තුළ සමහර එළවළු, පළතුරු හා නැවුම් මත්ස්‍ය වර්ග, අර්තාපල්, ලොකු ළූණු, රතු ළූණු සහ දෙහි ආදියෙහි මිල ගණන් මෙම මාසය තුළ ඉහළ ගියේය. කෙසේ වුව ද, බොහෝ එළවළු සහ නැවුම් මත්ස්‍ය වර්ග, අමු මිරිස් සහ බිත්තර ආදියෙහි මිල ගණන්වල පහළ යාමක් වාර්තා විය. ආහාර නොවන කාණ්ඩයේ, ප්‍රවාහන (සියයට 0.5 කින්); රෙදිපිළි හා පාවහන් (සියයට 0.2 කින්); සහ විවිධ භාණ්ඩ හා සේවා (සියයට 0.1 කින්) යන උප කාණ්ඩයන්හි මිල ගණන්වල ඉහළ යාම් වාර්තා විය. මේ අතර, නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන; ගෘහ උපකරණ හා දෛනික ගෘහ නඩත්තු; සෞඛ්‍ය; සන්නිවේදන; විනෝදාත්මක හා සංස්කෘතික; සහ අධ්‍යාපන යන උප කාණ්ඩයන්හි මිල ගණන් මෙම මාසය තුළ නොවෙනස්ව පැවතිණි.